කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2013

ජනවාරි - 2017

**BMGT E3025 – කුඩා ව්‍යාපාර කළමනාකරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : 06 (හයයි)

කාලය : පැය 03

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

01. (අ) කුඩා ව්‍යාපාරයක් යනු කුමක්ද? නිර්වචනය කරන්න.

(ලකුණු 05)

(ආ) මහා පරිමාණ සහ කුඩා පරිමාණ ව්‍යාපාර අතර වෙනස්කම් දක්වන්න.

(ලකුණු 05)

(ඇ) සංවර්ධනය වෙමින් පවතින රටක කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්හි කාර්යයන් සහ දායකත්වය සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

02. (අ) "ව්‍යවසායකයෝ යනු, අවදානම් දරන්නෝ වෙති". ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නෙහිද? සුදුසු නිර්වචන ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

(ආ) ව්‍යවසායකත්ව ආකෘතීන් මොනවාද? පැහැදිලි කරන්න.

(ලකුණු 09)

(ඇ) ව්‍යවසායකත්ව සංවර්ධන චක්‍රයේ මූලිකාංග පහදන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

03. "පසුගිය වසර ගණනාව තුළ කුඩා සහ ක්ෂුද්‍ර ව්‍යාපාර විශාල ප්‍රමාණයක් සිය ව්‍යාපාර කටයුතුවලදී අසමර්ථ වී ඇත."

(අ) උපාධි අපේක්ෂකයෙකු වශයෙන්, මෙම අසමර්ථයන්ට බලපාන හේතු හඳුනාගෙන ඉදිරිපත් කරන්න.

(ලකුණු 10)

(ආ) ඒවාට විසඳුම් දක්වන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

04. (අ) ව්‍යාපාරික අවස්ථාවක් යනු කුමක්ද?

(ලකුණු 03)

(ආ) ව්‍යාපාරික අවස්ථාවන් සාමාන්‍යයෙන් විවිධ ප්‍රභවයන්ගෙන් ඇතිවේ. ඒවා මොනවාද?

(ලකුණු 04)

(ඇ) ව්‍යාපාරික අවස්ථා පෙරා ලබා ගැනීමේ ක්‍රියාවලිය විස්තරාත්මකව පැහැදිලි කරන්න.

(ලකුණු 13)

(මුළු ලකුණු 20)

05. (අ) ව්‍යාපෘති වාර්තාවක ඇති වැදගත්කම දක්වන්න.

(ලකුණු 03)

(ආ) උපකල්පිත ව්‍යාපාරයක් සඳහා ව්‍යාපෘති වර්තාවක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 09)

(ඇ) ව්‍යවසායකයින්ට ව්‍යාපාර පහසුවෙන් කරගෙන යාම සඳහා ඒවාට ප්‍රමාණවත් සහ සුදුසු යටිතල පහසුකම් අවශ්‍ය වේ. පහත සඳහන් අංගයන්හිදී සලකා බැලිය යුතු ප්‍රධාන සාධක මොනවාදැයි පැහැදිලි කරන්න.

i. ඉඩම් සහ ගොඩනැගිලි
ii. තාක්ෂණය
iii. විදුලිය
iv. යන්ත්‍ර සහ උපකරණ

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

06. පහත සඳහන් මාතෘකා අතරින් හතරක් (04) සඳහා කෙටි සටහන් ලියන්න.

(අ) ක්ෂුද්‍ර පරිසරය
(ආ) ව්‍යවසායකයන් පිළිබඳ මිත්‍යාවන්
(ඇ) සාර්ථක ව්‍යවසායකයකුගේ ගතිලක්ෂණ
(ඉ) අලෙවිකරණ ශක්‍යතාවය
(ඊ) SWOT (ශුදුඅත) විශ්ලේෂණය

(ලකුණු 5 x 4 = 20)